Page 8 June 2010 .qxd 21/06/2010 18:07 Page 1



## කවි කොළය

# බණ ශාලාවට දෙව්ලොවින් දෙවියෙකු ආ දා!



ගරු හිමිනමක් කලු
සිවුරක් දැරුව උරෙන්
බණ දේසනාවක
නියැලෙයි මියුරු සරෙන්
පින්බර ජනී ජනයෝ
යුතු සැදැහැ බරෙන්
පතුරති සාදු නාදය
හැකි තරම වැරෙන්

ඒ හඬ සදෙව් ලොව දෙවියන් හටද ඇසී
එක් දේවතාවෙක් සැකයක් මතුව කිසී
දක්නට සැබෑ තතු විමසා කරුණු නිසී
අහසින් පැමිණ මේ බණ අසපුවට බසී

පළුවා අඳුර දිදුලන දිව බරණ රැසින්
දෙවියෝ සිටිත් අට ඉස්බක් බිමට උසින්
බැතිමත් පිරිස මේ පෙළහර දුටුව ඇසින්
නැගුවහ. සාදු හඬ කන්අඩි පැලෙන ලෙසින්

දෙවියා කියයි, ඔබ හැම මොහොතකට පෙර
දුටුවෙමි නිවන් පැතුවා. බණ අසන වර
දිය හැක ඔබට සසරෙහි දුක ඉවර කර
මා ළඟ යතුර ඇත නිවනෙහි අරින දොර

බව ගිම් නිවා සැනසීමට සියලු සත
මෙවෙසක් දිනේ බලයක් මා සතුව ඇත
එකියන නිවන් සුව විඳුමට අපරි මිත
රිසි අය වෙතොත් දැන් ඔසවනු මැනවි අත

ගොළු වී සිටිති බණ මඩුවේ සියළු දෙන
දෙවියා එයින් පසු අහසින් බිමට පැන
එහි සිටි පිරිස කැඳවා වෙන වෙනම ගෙන
ඇසුවා කරුණ නිවනට අකමැතිද යන

"කැමතියි, එහෙත්, හෙට පඩි දවසය මාගේ"
දුක පළ කළා මුලටම සිටි මිනිසා ගේ
"ඇයි ඔබ අදම ආවේ? කරුමෙට මාගේ
නැතිනම් දෙන්න තිබුණා මගෙ සහ යෝගේ"

"අද මා නිවන් දැක්කොත් සසරෙහි නැලී
කුණුවෙයි මාලු ටික පෙට්ටිය තුළ ලැලී"
පැහැදිලි කළා තතු ධීවර මුද ලාලී
කීවා නිදහසට තව තව දිග හැලී

දායක සභාපති, ලේකම්, ඇදුරු තුමා
ටියුෂන් ගුරා අපචාරෙහි යෙදුණු ළමා
දෙවියන් හමුවෙ බිලිකොකු මෙන් සිරුර නමා
නොයෙකුත් කරුණු කීවෝ නිදහසට තමා


පැවසූ කරුණු අසමින් මේ සියළු දෙන
පුදුමෙට පත්ව සිටි දෙවියා බැරිම තැන
ඔබවත් නිවන් දක්නට එන්නෙහිද යන
ඇසුවා පැනය හිමියන්ගෙන් දෙසුව බණ

"හෙට තියෙනවා ජනපති
මැදුරෙහි දානේ
මොනවා වුනත් ඒකට
නොගිහින් බෑනේ
තව බුදු කෙනෙක් එයි
කල්පය අවසානේ
බැරුවයි යන්න වෙන
දවසක නෙරුවානේ!"



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

## නිර්වානය ????



*නිර්වානය පහදා දෙන බුද්ධ මුද්‍රාව*

**මේ** වෙසක් පොසොන් සමය නිසා නිවන ගැන කතාබහ කරන්නට මීට වඩා සුදුසු කාලයක් නැත. මෙය කාලයක් තිස්සේ මා කතාකරන්නට ලියන්නට බලාපොරොත්තුව සිටි මාතෘකාවකි. මෙහි වම්පස ඇති තලංගම ජයසිංහ කිවිඳුන්ගේ කවිපෙළ කියවූ විට ඒ මට අමතකව තිබූ අදහස නැවත මතුව ආවේය. මාතෘකාව නිර්වාණය හෙවත් නිවනයි. එම වචනය සමග ප්‍රශ්නාර්ථ ලකුණ ඉහත යොදා ඇත්තේ සැබැවින්ම නිර්වාණය ලොවට අද ප්‍රශ්නයක්ව ඇති නිසා ය.

වාණ යනු තණ්හාවයි. නිර් - යනු නැති බවයි. නිර්වාණ යනු තණ්හාව හෙවත් තෘෂ්ණාව නැතිකිරීමයි. සිඳ ලැමයි. තෘෂ්ණාව නැති කළ සැනින් කෙනෙකුට නිවන අවබෝධවන බව බුදු දහම පහදා දෙයි. මාර්ග ඵල ලත් රහතන් වහන්සේලා කෙලෙස් හෙවත් තෘෂ්ණාව ප්‍රහීන කොට නිවන් අවබෝධ කරගෙන ස්වභාව ධර්මයට අනුව ජීවිතය අවසන මෙලොවින් නික්ම ගියහ. ඒ ගියේ කොහිදැයි කියන්නට කිසිවෙක් නොදනිති. ආකාශයේ කුරුල්ලන්ගේ පා සටහන් සොයාගත නොහැක් කාක් මෙන් උන්වහන්සේලා කොයි ගියේදැයි කිසිදු සල කුණක් නැත. දහම් පොත්වල නිවනටයෑම හෝ නිවන් දැකීම විස්තර කර ඇත්තේ එලෙසිනි.

බෞද්ධයෙකුගේ අවසාන අරමුණ නිවන්දැකීම බව අපි නිතර කියන්නෙමු. සිතන්නෙමු. කෙනෙකු මිය ගිය විට බෞද්ධ යෝ ඒ මරුණු කෙනාට නිවන් සුව ප්‍රාර්ථනා කරති. (එය දැන් බොහෝ විට කියන්නේ පුරුද්ද ටය.) ධර්ම දේශනාවක් අවසා-නයේ හෝ දානයක් දීමෙන් හෝ වෙනත් පිනක් සිද්ධකර ගැන්මෙන් අනතුරුව එයට සහභාගී වූ කාගේත් පැතීම නිවනය. එය නිකම්ම නිවන නොවේ. අජරාමර (නොදිරන නොමැරෙන) නිවනය. සදාකා ලිකවූ උතුම් වූ අමෘත මහා නිවන් සම්පත්තියයි. ඒ වචන වලින් නිවනෙහි අනර්ඝත්වය පැහැදිලි වේ. බුද්ධාදී උත්තම යින්ද නිවීසැනසී වදාළ බැවින් එය තවත් යෑමට සිත්දෙන ඉතා පිරිසුදු නිර්මල ස්ථානයකි.

මෙතේ බුදුන් දැක නිවන් දැකීම තවත් අරමුණකි. මෛත්‍රී බුදුන් දකින්නේ උන්වහන්සේ ගෙන් බණ අසන්නටය. එය නිසැකවම නිවනට පිවිසීමේ මගය. දැන් දැන් මේ ජීවිතයේ දීම නිවන් ලැබිය හැකියයි සමහරු පවසති. ඒ අනුව ඔව්හු කටයුතුකරගෙන යන බව ද කියති. එය සැබැවක් නම් එය සතුටට කාරණයකි.

එහෙත් සැබැවින්ම කෙනෙකුට නිවනට යාමට සිත් දෙන්නේදැයි අප දන්නේ නැත. ඇසූවොත් ඔව්හු හිතට එකඟව කතාකරන්නෝ වෙත්ද? මෙසේ ද දැක්විය හැකිය. නිවනට යෑමට ඕනෑ නමුත් දැන්ම නිවනට යෑමට බැරිය. තව කාල යක් සංසාරයේ කරක්ගසන්නට ආශාව ඇත. මේ ලොව හැම දෙයක්ම නෙපවතින දුකට හේතුවන බව දන්නා නමුත් මෙලොව අත්හැර යන්නට බැරි කම (භව තණ්හාව) අප කවුරුත් නිවනෙන් ඈත් කරයි.

දිරා අබලන්ව ගිය පරණ සපත්තු කූට්ටම වීසිකරන්නට ලෝබ නිසා තවම එය ගේ ඇතුලේ තිබේ. එසේ නම් මේ ලොවට ඇති බැඳීම් සියල්ල අත්හැර දමා මින් පිටවී යළි නොඑන්නටම යන්නට හිත හදාගත හැකිද? මුලු ලෝකයේ ම බෞද්ධයින්ගේ ප්‍රාර්ථනාව නිවන් දැකීම වුවත් මේ ලෝක යේ කිසිවෙකුට ඒ නිවනට යන්නට උවමනාවක් නැතිබව ස්ථිරවම කිව හැකිය. එහෙත් ඒ බව පිළිගන්නට කවුරුවත් කැමති නැත. යන නොයන එක වෙන දෙයකි. මේ කියවන ඔබ සැමට නිවන් සුව අත්වේවායි හෘදයාංගවම පතමි.

♦ දයා ආනන්ද



**ඉරිදා** - ලංකාවට ළඟදි ආ ගංවතුරෙන් නොසැහෙන්න හානි
**SUN** සිද්ධවෙලා. කැතරින් නැන්දලගෙ ගම්පහ ගෙදර යට වෙලා ගේ ඇතුළට වතුර දාලා. ගෙදර අය සේරම දවස් දෙකක්ම මේස උඩ, අල්මරිය උඩ, ඉස්තෝප්පුවෙ බිත්ති කණ්ඩිය උඩ, වගේ තැන්වලට නැගලා වතුර බහින කල් හිටියයි කියලා නැන්දා ඊයෙ කතා කළාම කිව්වා. ඒ දවස් දෙකේම අනේ නැන්දලා කාලා නෑ. ලංකාවෙ පත්තරේක තිබුණා කවුද මන්ත්‍රී කෙනෙක් යෝජනා කරලා දැන් හැමදාම ගංවතුර ගලන හන්දා කාර්එකක්, මෝටර් සයිකල් එකක් වගේ ලංකාවෙ හැම ගෙදරකටම බෝට්ටුවක් ගන්නඑක හොඳය කියලා. ඒ අදහස නරක නෑ. මං හිතන්නෙ ඒ මන්ත්‍රීගෙ අදහසක් ඇති පිටරටින් බෝට්ටු ගෙන්නන පවුලෙ බිස්නස් එකක් පටන්ගන්න.

**සඳුදා** - කාලගුණ දෙපාර්තමේන්තුව කියනව ගංවතුරට
**MON** මූලික හේතුව බෙංගාලෙ බොක්කෙ ඇති වෙච්ච සුළි සුළඟක්ය කියලා. අපි දන්නවා බෙංගාල බොක්කෙ සුළි සුළං අද ඊයෙ නෙවෙයි හැමදාම තිබුණා. ඒ අතරේ බොහොමයක් දෙනා විස්වාස කරනවා ලංකාව පුරාම තියන කුඹුරු ගොඩ කරලා මිනිස්සු ගෙවල් හදන්න හිටියට පස්සෙ තමයි මේ සේරම ගංවතුරවල් එන්න පටන්ගත්තෙ කියන එක. ඒක තමයි හරි හේතුව. නිකං බෙංගාලෙ බොක්කට බැනලා හරියන්නෙ නැහැ. දැන් ලංකාවෙ තියෙන්නෙ ගෙවල් හැදීමෙ තරඟයක්. වැඩිකල් නොගිහිං බංගලාදේශයට වෙච්ච වගේ මාස්පතා ලංකාවට ගංවතුර එන්න පටන්ගනීවි. පොඩි පොදක් ගැහුවත් කැළණිගඟ උතුරාවි. හැබැට අපේ මිනිස්සුන්ගෙ මොළේ කවදා පෑදේවිද? කවදාවත්ම පෑදෙන එකක් නෑ

**කුජදා** - මේ ළඟදි ඇමරිකන් ජනාධිපති ඔබාමා කියලා
**TUE** තිබුණා මෙච්චර කල් ඇමරිකාව ලෝක ත්‍රස්තවාද-යට එක හේතුවක් මුස්ලිම් ආගමය කියලා කිව්වත් මීට පස්සෙ එහෙම කියන්නෙ නැත, මුස්ලිම් ආගමයි ත්‍රස්තවාදයයි අතර කිසිම සම්බන්ධකමක් නැත කියලා. හුඟ දෙනෙක් පුදුම වෙනවා ඇයි ඔබාමා එහෙම කිව්වෙ කියලා. සමහරු කියනවා නිව්යෝර්ක් කුළුනට ගහපු විදියෙ තව ප්‍රහාරයක් අල්කයිඩා කාරයො ආයිත් ඇමරිකාවට එල්ල කරාවි කියන බයටය කියලා. තවත් අය කියනවා ඇමරිකාවට මැද පෙරදිග පෙට්‍රල් ලැබෙන්නෙ නැතුව යාවිය කියන බයටය කියලා. මොන හේතුවකට හරි ඇමරිකාවෙ මෙච්චරකල් තිබිච්ච ඔපය ටික ටික අඩුවෙලා යන හැටි පේනවා.

**බුදදා** - ගිය සතියෙ මම දැක්කා ලංකාවෙ දේශපාලන
**WED** නායකයෙක් මෙච්චර කල් කරපු හොඳම ටෙලිවිෂන් ඉන්ටර්වීව් එක. මැදපෙරදිග අල්ජසීරා නාලිකාව ජනාධිපති මහින්ද සමග කළ කතාබහ. ඒ කථනය කළ යුවතිය ශ්‍රීලංකා ජනාධිපතිගෙන් අහනවා, ඇත්තද ඔබේ නෑදෑයින් **300** කට තනතුරු දීලා, මුළු ආණ්ඩුවම නෑදෑයින්ගෙන් පුරවගෙන ඉන්නෙ කියලා. මහින්ද හිනාවෙලා කියනවා ඒකතාව බොරුවක් කියලා. ආයිත් ඒ කෙල්ල කියනවා, බොරු නෙවෙයි කවුරුත් එහෙම කියනවා කියලා. ඒකට මහින්ද දෙන උත්තරේ, තුන්සීයක් නෙවෙයි මුළු ලංකාව පුරාම ඉන්න හැම කෙනෙක්ම මගේ නෑයෙක් කියලා. කෙල්ල කට වහගත්තා. අන්න නියම ජනාධිපති. අන්න නියම නායකයා

**ගුරුදා** - අද රංජනී හම්බවුණා වෙම්බ්ලිවලදි. උපාලි අතේ
**THU** ලංකාවට සල්ලි වගයක් යවන්න ලෑස්තිවෙනවා. දැන් පවුම කීයද කියලා මගෙන් ඇහුවා. රංජනීලගෙ පවුලෙ හරි ගොඩක් සහෝදර සහෝදරියො එහේ ඉන්නවා. රන්ජනීගෙ වැඩේ හැම මාසෙම ඒ කාට හරි මෙහෙන් සල්ලි යවන එක. එයා කියනවා එහේ හැමෝම කියල එවන්නෙ හැමදාම නැති බැරිකමලු. ලෙඩ දුක්ලු. සතුටු දායක ආරංචියක් අවුරුදු ගණනකින් ඇහුවෙ නැත කිව්වා. එහේ කාට හරි උණක් හෙම්බිරිසාවක් හැදුනත් ඉස්සර වෙලාම කරන්නෙ හැතැප්ම හත්දාහක් මෙහේ ඉන්න රන්ජනීට පෝන් කරලා ඒක කියනවලු. හැබැයි පවුලෙ මඟුලක්, උත්සවයක් තිබුණට ඒවා කිසි දෙයක් කියන්නෙ නැත කිව්වා.

**කිවිදා** - සයිප්‍රස් වලින් පටන් අරගෙන පලස්තීනයේ ගාසා
**FRI** තීරයට මානුෂික ආධාර අරගෙන ගිය නැවකට මූදේ දි කඩාගෙන පැන්න ඊශ්‍රායෙල් හට කණ්ඩායමක් ඒ නැවේ නව දෙනෙක් මරලා, විසාල ගණනකට තුවාල කරලා. ඇමරිකාව එංගලන්තය බොරුවට කිව්වා, අපි ඊශ්‍රායෙලය හෙළා දකිනවා ඒ කරපු කැත වැඩේට කියලා. ඒ අර මොනවාහරි කියන්න ඕන නිසා. කොටි ත්‍රස්තයො මරපු එකට ලංකාව කන්න හදන, තවම ලංකාව පස්සෙ පන්නන මේ බටහිර පාහර රටවල් ඊශ්‍රායෙල් කාරයින් ආධාර නැවක යන මිනිස්සුන්ට පැනලා ගහලා මරලා කරපු අමානුෂික වැඩේට මුකුත් වැඩිය කියන්නෙ නෑ. එක්සත් ජාතීන්ගේ එවුනුත් කට පියාගෙන ඉන්නවා. අපි මුන්ගෙන් අහන්න ඕන තොපිට මේවට කටේ පිට්ටුද කියලා. මේ හැමදේකින්ම පේන්නෙ මුන්ගෙ දෙපිටකාට්ටුකම. මුන් මහ බොරුකාරයො.